ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
අමෙරිකා එක්සත් ජනපදය

இலங்கைத் தூதரகம்
ஐக்கிய அமெரிக்க நாடுகள்

**EMBASSY OF SRI LANKA**
**UNITED STATES OF AMERICA**

3025 Whitehaven Street NW
Washington D.C. 20008

Tel (202) 483-4025 Information
(202) 483-4026/4028 Staff

Fax (202) 232-7181

E-mail slembassy@slembassyusa.org

# President handed over interim report of Commission appointed to probe alleged human rights violations



The 'Presidential Commission of Inquiry for Appraisal of the Findings of Previous Commissions and Committees on Human Rights and the Way Forward' handed over its Interim Report to President Gotabaya Rajapaksa at the Presidential Secretariat on Wednesday (21 July).

The President in extraordinary gazettes issued on 21 January and 12 February appointed members to the Commission of Inquiry (CoI) to investigate, inquire and report or take necessary actions on findings of preceding commissions or committees appointed to investigate into human rights violations, serious violations of International Humanitarian Law (IHL) and other such offences. The commission is chaired by Supreme Court Judge A.H.M.D. Nawaz, and its other members are retired Inspector General of Police Chandra Fernando, retired District Secretary Nimal Abeysiri and former Mayor of Jaffna Yogeswari Patkunarajah.

The commission, which is not in agreement with the calls to repeal the Prevention of Terrorism Act (PTA), highlights in the interim report that the PTA should be reformed in line with the laws against the prevention of terrorism in other countries, including in the UK. The commission, which has paid special attention to Provisions 9, 11 and 13 of the PTA, has made three key recommendations in its interim report with regard to the implementation of the PTA in a more democratic manner. The commission highlighted the possibility to expedite the hearing of cases of those who are being detained for a minimum of three months or longer under Provision 9 of the PTA by filing indictments against them, and to confine the detainees to their own home or the residential area under special security instead of detaining them in prisons in line with Provision 11 of the PTA. The commission, in its interim report, proposed the importance of establishing an Advisory Board consisting of not less than three persons representing all ethnic groups, to advise the President or the Minister in charge of Defence under Provision 13 of the PTA.

It is the policy of the Government to work with the United Nations and its agencies to ensure accountability and human resource development in order to achieve lasting peace and reconciliation. The Government is committed to providing solutions for the issues to be resolved within the democratic and legal process and to ensure justice and reconciliation by implementing necessary institutional reforms.

The Presidential Commission of Inquiry for Appraisal of the Findings of Previous Commissions and Committees and the Way Forward has been mandated to handover its final report in the next six months.

Secretary to the President P.B. Jayasundera, Additional Secretary to the President T.T. Upulmalee, Foreign Secretary Admiral Jayanath Colombage and the Director General of Legal Affairs of the Presidential Secretariat Hariguptha Rohanadheera were also present.

Embassy of Sri Lanka
Washington D.C.
21 July 2021

මාධ්‍ය නිවේදනය

ஊடக வெளியீடு

PRESS RELEASE



Tel : 011 2 386572 Fax : 011 2 333717

ජනාධිපති මාධ්‍ය අංශය, ජනාධිපති කාර්යාලය, කොළඹ 01

சனாதிபதி ஊடகப் பிரிவு, சனாதிபதி அலுவலகம், கொழும்பு 01

President's Media Division, President's Office, Colombo 01



නිවේදන අංක - 21/174

2021-07-21 පෙ.ව.11.25ට


# මානව හිමිකම් කඩකිරීම් සිදුව ඇති දැයි විමර්ශනයට පත්කළ කොමිසමේ අතුරු වාර්තාව ජනපතිට භාරදෙයි...

මානව හිමිකම් පිළිබඳ පූර්ව කොමිසම් සහ කමිටුවල තීරණ ඇගයීම සහ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිසම සිය අතුරු වාර්තාව ඊයේ (20) පස්වරුවේ ජනාධිපති කාර්යාලයේ දී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා වෙත භාර දුන්නේය.

මානව හිමිකම් සහ අන්තර්ජාතික මානුෂීය නීතිය කඩකිරීම් සහ සමාන බරපතළ වැරදි පිළිබඳ චෝදනා විමර්ශනය පිණිස පත්කළ කොමිසන් සභා හෝ කමිටු අනාවරණය කරගත් තොරතුරු විමර්ශනය, පරීක්ෂණය සහ වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ජනාධිපතිතුමා විසින් 2021 ජනවාරි මස 21 සහ පෙබරවාරි මස 12 වන දිනයන්හි අති විශේෂ ගැසට් නිවේදන මගින් කොමිසමට සාමාජිකයන් පත්කරනු ලැබිණ.

ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ඒ.එච්.එම්.ඩී. නවාස් මහතාගේ සභාපතිත්වයෙන් යුත් කොමිසමේ සෙසු සාමාජිකයෝ ලෙස විශ්‍රාමික පොලිස්පති චන්ද්‍රා ප්‍රනාන්දු, විශ්‍රාමික දිස්ත්‍රික් ලේකම් නිමල් අබේසිරි සහ <u>**යාපනය හිටපු නගරාධිපති යෝගේෂ්වරී පත්කුණරාජා**</u> යන මහත්ම මහත්මීහු පත්කර සිටිති.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කළ යුතු යන මතවාදයට එකඟ නොවන කොමිසම් සභාව, මහා බ්‍රිතාන්‍ය ඇතුළු සෙසු රටවල ත්‍රස්තවාදය වැළැක්වීම සඳහා හඳුන්වා දී ඇති නීති අධ්‍යයනය කර පනත සංශෝධනය කළ යුතු බව අතුරු වාර්තාව මගින් පෙන්වා දෙයි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 9,11 සහ 13 වගන්ති කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඇති කොමිසම, වඩා ප්‍රජාතන්ත්‍රවාදී ස්වරූපයකින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ක්‍රියාත්මක කිරීම පිළිබඳ යෝජනා තුනක් අතුරු වාර්තාව මගින් ඉදිරිපත් කර තිබේ.

9 වන වගන්තිය මගින් රැඳවුම් නියෝග ක්‍රියාත්මක කිරීමේ දී අවම මාස තුනක් හෝ ඊට වැඩි කාලයක් රඳවා තබාගන්නා පුද්ගලයන්ට අධි චෝදනා ගොනුකර නඩු අසා නිම කිරීමත්, 11 වන වගන්තිය යටතේ වූ රැඳවුම්කරුවන් බන්ධනාගාරය තුළ රඳවා තබා ගැනීම වෙනුවට විශේෂ ආරක්ෂාවක් යටතේ සිය නිවසේ හෝ ගම් ප්‍රදේශය තුළ රඳවා තබා ගැනීමට ඇති හැකියාව පෙන්වා දී තිබේ.

13 වන වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයාට උපදෙස් දීමට අවම වශයෙන් නිදෙනෙකුගෙන් සමන්විත, සියලු ජාතීන් නියෝජනය කෙරෙන උපදේශන සභාවක් පත් කිරීමේ වැදගත්කම කොමිසම අතුරු වාර්තාව මගින් යෝජනා කරයි.

තිරසර සාමය සහ සංහිඳියාව දිනාගනු වස් වගවීම සහ මානව සම්පත් සංවර්ධනය සපුරා ගැනීම සඳහා එක්සත් ජාතීන් සහ එහි නියෝජිත ආයතන සමග සහයෝගයෙන් වැඩ කිරීම රජයේ ප්‍රතිපත්තිය වන්නේය. විසඳීමට ඇති ගැටලු සඳහා ප්‍රජාතන්ත්‍රවාදී නීති රාමුව තුළ විසඳුම් දීමටත්, අවශ්‍ය පරිදි ආයතනික සංශෝධන කරමින් යුක්තිය හා සංහිඳියාව තහවුරු කිරීමටත් රජය කැපවී සිටී.

කොමිසමේ අවසන් වාර්තාව ඉදිරි මාස 6 තුළ ලබාදීමට පූර්ව කොමිසම් සභාවන්හි සහ කමිටුවල තීරණ ඇගයීම සහ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිසමට අවකාශය සැලසේ.

ජනාධිපති ලේකම් පී.බී. ජයසුන්දර, ජනාධිපති අතිරේක ලේකම් ඊ.ඊ. උපුල්මලී, විදේශ ලේකම් අද්මිරාල් ජයනාත් කොළඹගේ සහ ජනාධිපති නීති අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥ හරිගුප්ත රෝහණධීර යන මහත්ම මහත්මීහු මේ අවස්ථාවට එක්ව සිටියහ.

**ජනාධිපති මාධ්‍ය අංශය**

**2021-07-21**



**Gotabaya Rajapaksa**
@GotabayaR

We are committed to work with the @UN to ensure accountability & human dev. to achieve lasting peace & reconciliation. We are dedicated to resolving the issues within the democratic & legal frame to ensure justice & reconciliation by implementing necessary institutional reforms.



8:22 AM · Jul 21, 2021 · Twitter for iPhone